# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1986/46 - 2016 සැප්තැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : RPDS/LND/09/ACQ/05/09.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ උඩ පත්තුව සුළු කොට්ඨාසයේ, 152 B වෙරළුප ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රත්නපුර නගරය (කොට්ඨාස අංක 3 වෙරළුප, රත්නපුර මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක ර. 313 මුලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.3729 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල වේ.

**01. කැබලි අංක 01**

ඉඩමේ නම:දිවුල්ගහ කුඹුර, මුල්වක්කඩ, ගොඩකැලේ; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; මුල් හිමිකම් කියන්නා: එච්. එම්. ෂෙල්ටන් ප්‍රේමතිලක සහ එච්. ජයලාල් ප්‍රේමසිංහ, දෙමුවාවත, රත්නපුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3729.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 නොවැම්බර් මස 25 වැනි දින පෙ. ව. 10.00ට රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2016 නොවැම්බර් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
රත්නපුර,

2016 සැප්තැම්බර් මස 28 වන දින,

10-358

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24291 - 17 - (2016/09)